THE WORLD BANK
IBRD • IDA | WORLD BANK GROUP

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP)

ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

මූල්‍ය කළමනාකරු

ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP) යනු ලෝක බැංකුවේ (WB) මූල්‍ය ආධාර යටතේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 150 ක් වන අතර, 2024-2028 කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක පුරා ප්‍රාථමික සෞඛ්‍ය සේවාවන්හි ප්‍රවේශය සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා මෙය සැලසුම් කර ඇත.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) පහත සඳහන් තනතුර පිරවීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. එක් එක් තනතුර සඳහා වන වේතන ගෙවීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2026 මාර්තු 03 දිනැති අංක 02/2026 දරන චක්‍රලේඛය මත පදනම් වනු ඇත.

තනතුර	තනතුරු සංඛ්‍යාව	කාණ්ඩය (අංක 02/2026 දරන චක්‍රලේඛයට අනුව)	සුදුසුකම්
මූල්‍ය කළමනාකරු	01	C	සුදුසුකම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 02/2026 දරන චක්‍රලේඛයට අනුව වන අතර, එහි ඇමුණුම 1 හි "ඇමරිකානු ඩොලර් මිලියන 25 ට වැඩි සහ ඇමරිකානු ඩොලර් මිලියන 250 ට අඩු හෝ ඊට සමාන" යන තීරුව යටතේ ඇති සුදුසුකම් වෙත යොමු වන්න (පහත 1 හෝ 2 හෝ 3). 01. අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / ඊට සමාන වෘත්තීය සුදුසුකමක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 8 ක පළපුරුද්දක් තිබීම. 02. අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අධි සාමාජිකත්වයක් / ඊට සමාන වෘත්තීය සුදුසුකමක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 06 ක පළපුරුද්දක් තිබීම. 03. රජයේ දීප ව්‍යාප්ත සේවාවක I වන ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ ඊට සමාන තත්ත්වයක් දරන නිලධාරියෙකු වීම සහ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / ඊට සමාන වෘත්තීය සුදුසුකමක් සමඟ I වන ශ්‍රේණියේ තනතුරක හෝ අදාළ ක්ෂේත්‍රයේ ඊට සමාන තත්ත්වයක අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් තිබීම.

ඉහත තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද සහ වගකීම්, කුසලතා සහ නිපුණතා, ප්‍රධාන රාජකාරි සහ පොදු කොන්දේසි පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සඳහා කරුණාකර පහත සබැඳියෙන පිවිසෙන්න:

http://phsep.lk/document/fm.pdf

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය: 2026 දෙසැම්බර් 07

අධ්‍යාපනික, පළපුරුදු සහ අනෙකුත් සුදුසුකම්වල සහතික පිටපත් සහ සම්බන්ධ කර ගත හැකි දුරකථන/ෆැක්ස්/විද්‍යුත් තැපැල් ලිපිනයන් ඇතුළත් සවිස්තරාත්මක ජීව දත්ත පත්‍රිකාවක් (නිශ්චිත ආකෘතියක් නොමැත) සමඟ අයදුම්පත්, "මූල්‍ය කළමනාකරු තනතුර සඳහා වන අයදුම්පත (අයදුම් කරන තනතුර) - ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP)" යන ශීර්ෂය යටතේ 2026 දෙසැම්බර් 07 වන දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් (පමණක්) එවිය යුතුය.

ලිපිනය:
ව්‍යාපෘති අධ්‍යක්ෂ,
ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP),
191 A, ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, "බංගලාව", ධර්මපාල මාවත, කොළඹ 07
වැඩිදුර විස්තර

විද්‍යුත් තැපෑල : info@phsep.lk
දුරකථන : 0112 271150

අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද, කුසලතා සහ නිපුණතා සපුරා නොමැති, ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ, සනාථ කිරීමේ ලේඛන ඇතුළත් නොකළ, සහ ලියාපදිංචි තැපැලෙන් හැර වෙනත් ඕනෑම ක්‍රමයකින් (විද්‍යුත් තැපැලෙන්, අතින් ගෙනැවිත් භාරදීමෙන් හෝ වෙනත් ඕනෑම ලිපිනයකට) එවනු ලබන අයදුම්පත් සලකා බලනු නොලබන අතර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ව්‍යාපෘති අධ්‍යක්ෂ
ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP)
2026 නොවැම්බර් 22